**ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව - 2020**

**---------------------------------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

--------------

## 1.1 තත්ත්වාගණනය කළ මතය

--------------------------------

**ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාවේ 2020 දෙසැම්බර් 31** දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සභාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

----------------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරනපාර්ශවයන්ගේ වගකීම්

------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සභාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

-------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේ දී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2015 වර්ෂයේ දී ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව ස්ථාපනය කරන අවස්ථාවේ දී පරමාණුක ශක්ති අධිකාරියෙන් රු. 14,044,902 ක වත්කම් හා රු. 5,414,755 ක වගකීම් පවරා දී තිබුණි. ඒ අනුව සභාවට රජයෙන් ලද ශුද්ධ ප්‍රාග්ධන ප්‍රදානය රු. 8,630, 147 ක් ලෙස එම වර්ෂයේ දී හඳුනාගෙන තිබුණි. කෙසේ වුවද මෙම ප්‍රදානයට එරෙහිව ආදායම වාර්ෂිකව හඳුනාගැනීම (ලද ප්‍රදානය ක්‍රමක්ෂය කිරීම) ප්‍රදානයේ මුළු අගය ඉක්මවා සිදු කර තිබීම හේතුවෙන් 2020 | විගණනය විසින් පෙන්වා දී ඇති මෙම කරුණ හොඳින් අධ්‍යනය කර 2021 වර්ෂයේ දී එය නිවැරදි කිරීමට කටයුතු කරන බව කාරුණිකව දැනුම් දෙමි. | නිවැරදි ගිණුම්කරන ප්‍රතිපත්ති අනුගමනය කළ යුතු වීම. |

දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි පරමාණුක ශක්ති අධිකාරියට අදාල සමුච්චිත අරමුදලේ වටිනාකම රු. 3,821,793 ක හර ශේෂයක් ගෙන තිබුණි.

### 1.5.3 නීතිරීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| **නීති,රීති,රෙගුලාසි ආදියට යොමුව** | **අනුකූල නොවීම** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| **(අ) 2014 අංක 40 දරන ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති පනත** | | | |
| 82 (1) වගන්තිය | නියාමන සභාවේ සියලු නිලධරයන් තම කාර්ය භාරගැනීමට පෙර සභාවේ වැඩ කටයුතු සම්බන්ධයෙන් වූ සියලු කරුණු පිළිබඳ සම්පූර්ණ රහස්‍යතාව රකින බවට ප්‍රතිඥා දෙමින් ප්‍රකාශයකට අත්සන් කළ යුතු වුවත් නියාමන සභාව විසින් ඊට අනුකූලව කටයුතු කර නොතිබුණි. | සියළු පත්වීම් ලිපිවල 16 වන ඡේදය තුල පැහැදිලිවම සඳහන් කර ඇත. ඊට අනුගතව සේවකයා විසින් එයට අත්සන් කර බැඳී ඇත. | **පනතේ** 82 (1) වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| **(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | |
| මුදල් රෙගුලාසි 128 (1) (ජ) | සභාවේ නිලධාරීන් පස්දෙනෙකු සහනදායි පදනම මත මෝටර්රථ බලපත්‍ර හිමිකම් ලැබීමට නියමිත දිනට ආසන්න වශයෙන් වසර 01ත් 06ත් අතර කාලයකට පෙර පළමු බලපත්‍රය ලබාගෙන තිබුණි. | අධිකරණය විසින් දී ඇති තීරණය හා නීතිපති දෙපාර්තමේන්තුවේ පැහැදිළි කිරීම් මත කටයුතු කරමි. | මුදල් රෙගුලාසි 128 (1) (ජ) ප්‍රකාරව නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී | | | |

| | | | |
|---|---|---|---|
| **ජනරජයේ ආයතන සංග්‍රහය** | | | |
| (i) II වැනි පරිච්ඡේදයේ 9 : 1 ඡේදය | අමාත්‍ය මණ්ඩලයේ පූර්ව අනුමැතිය රහිතව වර්තමාන අධ්‍යක්ෂ ජනරාල්වරයා හට 2021 මාර්තු 01 දින සිට මාස 06 ක සේවා දිගුවක් ලබා දී තිබුණි. | පරමාණුක බලශක්ති පනතේ 71 (3) වගන්තිය යටතේ ගරු අමාත්‍යවරයාට ලැබී ඇති බලතල අනුව දැනට සිටින අධ්‍යක්ෂ ජනරාල්වරයා ඉදිරි මාස 06 ක කාලය සඳහා කොන්ත්‍රාත් පදනම මත පත් කර ඇත. | විශ්‍රාම යා යුතු වයස් සීමාවෙන් ඔබ්බට සේවය දීර්ඝ කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගත යුතු වීම. |
| (ii) II වැනි පරිච්ඡේදයේ 15:1 (ix) ඡේදය | අදාළ පරිච්ඡේදය පරිදි නියාමන සභාව විසින් කාර්යක්ෂමතා කඩඉම් විභාග පවත්වා නොතිබුණු අතර කාර්යක්ෂමතා කඩඉම් සමත් වීමෙන් තොරව නිලධාරින්ට වැටුප් වර්ධක ලබා දී තිබුණි. | කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීමට අදාලව අවශ්‍ය කටයුතු කිරීමට පමා වීම නිවැරදිවේ. | නියමිත දිනට කාර්යක්ෂමතා කඩඉම් පැවැත් වීම සඳහා කටයුතු කළ යුතු වීම. |
| **(ඇ)වත්කම් කළමනාකරණ චක්‍රලේඛ** | | | |
| 2017 ජුනි 28 දිනැති 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය | 2018 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා මිලදී ගන්නා ලද රු. 33,100,727 ක් වටිනා වත්කම් අයිතම 152 ක් පිළිබඳව තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් වෙත ඉදිරිපත් කර නොතිබුණි. මින් රු. 15,057,003 ක් වටිනා වත්කම් අමාත්‍යාංශ ප්‍රතිපාදනවලින් මිලදී ගෙන තිබුණු අතර රු. 18,043,724 ක් වටිනා වත්කම් පරිත්‍යාග ලෙස ලැබී තිබුණි. | කොම්ප්ට්‍රෝලර් ජනරාල් විසින් ලබා දී ඇති උපදෙස් වලට අනුව තොරතුරු යවා ඇති අතර ඉදිරියේ දී අනෙකුත් තොරතුරු යැවීමට කටයුතු කරමි. | මිල දී ගත් වත්කම් පිළිබඳ නිවැරදි තොරතුරු නියමිත කාල වකවානු තුළ කොම්ප්ට්‍රෝලර් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කළ යුතු වීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 4,752,640 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 8,874,702 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 4,122,062 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මුළු වියදම රු. 4,008,662 කින් අඩුවීම හා මුළු ආදායම රු. 113,400 කින් වැඩි වීම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) පනතේ 11 (ඊ) වගන්තිය අනුව අයනීකාර විකිරණයෙන් ආරක්ෂා වීම, ප්‍රභවයන් සහ වෙනත් විකිරණශීලි ද්‍රව්‍යයන්හි ප්‍රවේසම හා සුරක්ෂිතතාවය සහ විකිරණශීලි අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් ජාතික ප්‍රතිපත්තියක් සහ ක්‍රමෝපායක් සකස් කළ යුතු වුවත් සභාව පිහිටුවා වසර 06 ක් ගත වුවද, එම කටයුතු අවසන් කොට නොතිබුණි. | කෙටුම්පත් ප්‍රතිපත්තිය මහජන අදහස් ලබා ගැනීම සඳහා සභාවේ වෙබ් පිටුවෙහි ඇතුළත් කර ඇත. | මෙම ප්‍රතිපත්තිය සකස් කිරීමේ කටයුතු කඩිනම් කළ යුතු වීම. |
| (ආ) නියාමන සභාව විසින් පනතේ 12(ඕ) වගන්තිය ප්‍රකාරව විකිරණ ආරක්ෂණ සේවා සැපයුම්කරු වශයෙන් මණ්ඩලය වෙත අනුමතය ප්‍රදානය කර නොතිබුණු අතර ඒ සඳහා කාර්ය පටිපාටි හෝ යාන්ත්‍රණයක් ඇති කර නොතිබුණි. | මෙම සේවා සඳහා පනත මඟින් මණ්ඩලය වෙත බලතල ලබා දී ඇත. | නියාමන සභාව විසින් පනතේ සඳහන් කාර්යයන් ඉටු කළ යුතු වීම. |
| (ඇ) පනතේ 49 වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකාවට ආනයනය හා අපනයනය කළ හැකි න්‍යෂ්ටික ද්‍රව්‍ය, උපකරණ සහ තාක්ෂණයන් පිළිබඳ ලැයිස්තුවක් පිළියෙල කර ගැසට් පත්‍රයේ පළ කළ යුතුය. එසේ වුවද, පරමාණුක බලශක්ති නියාමන සභාව විසින් ඊට අනුකූලව කටයුතු කර නොතිබුණි. | මෙම ලැයිස්තුව පිළියෙල කල හැක්කේ ශ්‍රී ලංකාව විසින් අදාල ආරක්ෂණ ගිවිසුම අත්සන් කිරීමෙන් පසුවය. ආරක්ෂණ ගිවිසුම අත්සන් කිරීමට අවශ්‍ය කටයුතු සූදානම් කරමින් පවතී. | පනතේ වගන්තිය ප්‍රකාරව කටයුතු කල යුතු වීම. |
| (ඈ) පනතේ 86 (1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යවරයා විසින්, මෙම පනත යටතේ නියම කරනු ලැබූ සියලු කාරණා සම්බන්ධයෙන් ද මෙම පනත යටතේ නියෝග සෑදීමට බලය දෙනු ලැබූ සියලු | විකිරණ ආරක්ෂාව සහ ප්‍රවේසම සඳහා වූ නියෝග දැනට කෙටුම්පත් කර ඇති අතර එහි අවසාන කෙටුම්පත ජාත්‍යන්තර | පනතේ බලය දී ඇති කරුණු සම්බන්ධයෙන් නියෝග සෑදීම. |

| | | |
|---|---|---|
| කාරණා සම්බන්ධයෙන් ද නියෝග සාදනු ලැබිය යුතුය. එහෙත් පරමාණුක බලශක්ති නියාමන සභාව විසින් ඊට අනුගතව කටයුතු කර නොතිබුණි. | පරමාණුක බලශක්ති ඒජන්සියේ විශේෂඥයකු විසින් සමාලෝචනය කර ඇත. | |
| (ඉ) පනතේ 87 (1) වගන්තියෙහි දක්වා ඇති විකිරණශීලි ද්‍රව්‍ය හා විකිරණශීලි අපද්‍රව්‍ය ශ්‍රීලංකා ජනරජයට, ඉන් පිටතට හා එහි ඇතුළත ප්‍රවාහනය කිරීම, න්‍යෂ්ටික හෝ විකිරණශීලි හදිසි අවස්ථා තත්ත්වයන්ට සූදානම්ව සිටීම සහ ප්‍රතිචාර දැක්වීම, විකිරණ සේවකයන්ගේ සුදුසුකම් සඳහා උපමාන සැකසීම ආදී කරුණු සම්බන්ධයෙන් සභාව විසින් රීති සාදනු ලැබිය යුතු වුවත් ඊට අනුගතව කටයුතු කර නොතිබුණි. | දැනට විකිරණශීලී ද්‍රව්‍ය ප්‍රවාහනය සඳහා ජාත්‍යන්තර පරමාණුක බලශක්ති ඒජන්සිය විසින් නිකුත් කර ඇති විකිරණශීලී ද්‍රව්‍ය ප්‍රවාහනය සඳහා වන රෙගුලාසි භාවිතා කරයි. ඉදිරියේදී මෙම රෙගුලාසි භාවිතා කර ශ්‍රී ලංකාවට ගැලපෙන කොටස් පමණක් භාවිතා කර රීති සෑදීමට කටයුතු කරනු ලැබේ. | සභාවට රීති සෑදීමට බලය දෙන ලද සියලු කරුණු සම්බන්ධයෙන් රීති සෑදිය යුතු වීම. |